# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,053 - 2018 ජනවාරි මස 05 වැනි සිකුරාදා - 2018.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 02 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) සිවිල් ගුවන්සේවා (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජනවාරි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2018 ජනවාරි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජනවාරි මස 26 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජනවාරි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1- B 081240 — 353 (2018/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ගම්පහ දිසා අධිකරණයේ දී ය

1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනතේ 43 වන වගන්තිය සමග කියවෙන සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදය ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමයි.

නඩු අංකය : 4846/විශේෂ
ස්වභාවය : විශේෂ
වටිනාකම : රු. 12,00,000
කාර්ය පටිපාටිය : ලඝු
පිස්කල් අංකය : 67/2017

සමුදුරගේ නිලන්ති,
අංක 126, නාරම්මිණිය පාර,
වරාගොඩ, කැළණිය.

...............................*පෙත්සම්කාර ණයහිමි.*

*එදිරිව*

ලංකා හලුගේ හර්මන් ග්‍රෙගරි ජෝශප් ප්‍රනාන්දු,
අංක 618, නාරම්මිණිය පාර,
බංගලාවත්ත, කැළණිය.

............................වගඋත්තරකාර ණයකරු.

මෙම අධිකරණයේ වර්ෂ 2016 ක් වූ ජනවාරි මස 17 වැනි දින දරන තීන්දු ප්‍රකාශය පරිදි වග උත්තරකාර ණයකරු විසින් පෙත්සම්කාර ණයහිමිට ගෙවීමට නියමිතව තිබූ රුපියල් දොළොස් ලක්ෂය (රු.12,00,000) ක මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් එම මුදල ද වෙන්දේසි ගාස්තු ද වගඋත්තරකාර ණයකරු ගෙන් අයකර ගැනීම සඳහා තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 21 වැනි දින පස්වරු 03.00 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කැළණිය උප කාර්යාලයට අයත් අංක 262 පෙතියාගොඩ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පෙතියාගොඩ ග්‍රාමයේ නාරම්මිණිය පාර දෑනට වරිපනම් අංක 104 (කොටස) නම් බංගලාවත්ත *හෙවත්* කෝන්ගහවත්ත නමැති ඉඩමට අවසරලත් මිනින්දෝරු කේ. එම්. එස්. හේවාමානගේ මහත්මිය විසින් වර්ෂ 2008 සැප්තැම්බර් මස 22 වන දින මැන සාදන ලද අංක 247 ඒ නම් පිඹුරේ සඳහන් 1ඒ 2 නම් කැබැල්ලට එකී මිනින්දෝරු මහත්මිය විසින් 2012.06.01 වැනි දින සාදන ලද අංක 1098 නම් පිඹුරේ සඳහන් X නම් කැබැල්ල වන උතුරට : නාරම්මිණිය පාර සහ අංක 247 පිඹුරේ 1ඒ 1 ද, නැගෙනහිරට : අඩි 10ක් පළල පාර (අංක 1730) පිඹුරේ කැබලි අංක 2) ද දකුණට : එච්. ආර්. සුගතදාසට අයිති වරිපනම් අංක 104/2 දරන දේපළ (අංක 1730 පිඹුරේ කැබලි අංක 14) ද බස්නාහිරට : වික්‍රමආරච්චි සහ ඇන් පෙරේරාගේ ඉඩම සහ සි. ජී. වික්‍රමසිංහ අයිති පිඹුරු අංක 247 පිඹුරේ කැබලි අංක 1ඒ ද (අංක 189 පිඹුරේ කැබලි අංක 1 බී ද) යන මායිම් තුල වූ පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 15.50) විශාලත්වය ඇති බිම් කැබැල්ල සහ ඒ තුළ පිහිටි දේ ද වේ. (මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ සී 669/279 හි ලියාපදිංචි කර ඇත.)

ඉහත සඳහන් දේපළ නව මැනුමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කැළණිය උප කාර්යාලයට අයත් අංක 262 පෙතියාගොඩ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පෙතියාගොඩ ග්‍රාමයේ නාරම්මිණිය පාර දෑනට වරිපනම් අංක 104 (කොටස) නම් බංගලාවත්ත *හෙවත්* කෝන්ගහවත්ත නැමති ඉඩමට අවසරලත් මිනින්දෝරු කේ. එම්. එස්. හේවාමානගේ මහත්මිය විසින් වර්ෂ 2008 සැප්තැම්බර් මස 22 වන දින මැන සාදන ලද අංක 247 ඒ නම් පිඹුරේ සඳහන් 1ඒ 2 නම් කැබැල්ලට එකී මිනින්දෝරු මහත්මිය විසින් 2012.06.01 වැනි දින සාදන ලද අංක 1098 නම් පිඹුරේ සඳහන් X නම් කැබැල්ල වන උතුරට : අංක 247 පිඹුරේ 1ඒ1 නම් කැබැල්ල නාරම්මිණිය පාර සහ Y නම් කැබැල්ල ද, නැගෙනහිරට : Y නම් කැබැල්ල ද, දකුණට : දෑනට එච්. ආර්. සුගතදසට අයිති වරිපනම් අංක 104/2 දරන අංක 1730 පිඹුරේ කැබැලි අංක 14 ද, බස්නාහිරට :

දැනට පිළිවෙලින් වික්‍රමආරච්චි සහ ඇන් පෙරේරාගේ ඉඩම ද අංක 247 පිඹුරේ කැබැලි අංක 1ඒ1 කැබැල්ල සහ දැනට සී. පී. වීරසිංහ සහ අයට අයත් ඉඩම වන අංක 189 පිඹුරේ කැබැලි අංක 1බී ද යන මායිම් තුල වූ පර්චස් එකොළහයි දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 11.68) විශාලත්වය ඇති බිම් කැබැල්ල සහ ඒ තුළ පිහිටි දේ ද වේ.

ඒ. එච්. අදිකාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - ගම්පහ.

වර්ෂ 2017 ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින දී ය.

01-95

---

**සිවිල් නඩු විධාන සංග්‍රහයේ 256 වන වගන්තියට එකඟව පිස්කල් විසින් කරනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

කොළඹ දිසා අධිකරණ,
නඩු අංක : ඩී. එම් බී. 00057/2009
මිණුවන්ගොඩ දිසා අධිකරණය,
ඇස්කීසි අංකය : 75/2017

ඩී. එෆ්. සී. සී. බැංකුව,
73/5, ගාලු පාර, කොළඹ 03,
*සහ*
ශාඛා කාර්යාලය, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

..............................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. කුරුගමගේ සුගතපාල පෙරේරා,
වල්පොල, ආඬිඅම්බලම, ආඬිඅම්බලම, වල්පොල, ''ඉසුරු දිසි කොහු මෝල'' යන නාමය අභිධානය සහ විලාසය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යයි.

2. කුරුගමගේ ඥණවති පෙරේරා හේමචන්ද්‍ර,
වල්පොල, ආඬිඅම්බලම.

3. ගීකියනගේ එමලින් ප්‍රනාන්දු,
වල්පොල, ආඬිඅම්බලම.

.............................*විත්තිකරුවෝ.*

වර්ෂ 2013.09.09 වැනි දින කොළඹ දිසා අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන්නට යෙදුනු පහත සඳහන් නඩුවේ තීන්දුව ප්‍රකාරව මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපල 2017 ක් වූ නොවැම්බර් මස 02 වන දින මා විසින් තහනම් කිරීමෙන් පසු ඉහත කී 1 වන සහ 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති රුපියල් 1,760,000 ක මුදලක් ද හා එම මුදලට තීන්දුවේ දිනය එනම් 2013.09.09 දින සිට මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් වසරකට 16% ක පොලියක් ද නඩු ගාස්තුද, ගෙවා ඇති (යම්) මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රයේ බලය පිට 2017 නොවැම්බර් මස 02 වන දින තහනමට ගෙන ඇති ඉහත 1 වන හා 2 වන විත්තිකරුවන්ට අයත් පහත සඳහන් උපලේඛනයේ මැනවින් විස්තර කර ඇති නිශ්චල දේපල වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 02 වන දින ප.ව. 2.30 ට විත්තිකරුවන්ගේ දේපල පිහිටි ස්ථානයේදී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල වල්පොල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කේ. කන්නන්ගර විසින් මැන සාදන ලද වර්ෂ 2002 දෙසැම්බර් 12 වන දින දරන අංක 1152/2002 දරන පිඹුර ප්‍රකාර හැඩවකගහලන්ද නමැති ඉඩමේ ලොට් 1 දරන බෙදාවෙන්කල කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේම ලොට් ඒ ද, නැගෙනහිරට ප්‍රාදේශීය සභා පාර, දකුණට : ජී. තිසේරා ප්‍රනාන්දුට අයත් ඉඩමද බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් ඒ යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසිහතරයි දශම පහක් (අක් 0, රූ. 2, පර්. 24.5) විශාල ඉඩම හා ඊට අයත් සැම සියලු දේම වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 892/54 හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දසිය පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල වල්පොල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කේ. කන්නන්ගර විසින් මැන සාදන ලද වර්ෂ 2002 දෙසැම්බර් 12 දින දරන අංක 1152/2002 දරන පිඹුර ප්‍රකාර හැඩවකගහලන්ද, නමැති ඉඩමේ ලොට් 2 දරන බෙදාවෙන් කල කොටසට මායිම් උතුරට : අඩි 10 පළල පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් ඒ ද, දකුණට : පාර ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහයි දශම එකක් (අ. 0, රූඩ් 1, පර් 12.1) විශාල ඉඩම හා ඊට අයත් සැම සියලු දේම වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 892/55 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් පිඹුරු පත් අංක 1152/2002 දරන පිඹුරේ විස්තරාත්මකව දක්වෙන ලොට් අංක 1 සහ 2 වශයෙන් වඩාත් විස්තරාත්මකව දක්වෙන ඉහත කී ඉඩම් කොටස් දෙක පහත ඉඩම් දෙක ඒකාබද්ධ කීමෙන් සැදුනු එකකි.

1. ඉහත කී වල්පොල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් මැන සාදන ලද වර්ෂ 1966 මැයි මස 08 දින දරන අංක 667 දරන පිඹුර ප්‍රකාර හැඩවකගහලන්ද නමැති ඉඩමේ ලොට් සී දරන බෙද වෙන් කළ කොටසට මායිම් උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : කරත්ත පාර ද, දකුණට : ජී තිසේරා ප්‍රනාන්දුට අයත් ඉඩම ද, බස්නාහිරට : ලොට් ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසිහයයි දශම පහයි හතරක් (අක්. 0, රූ. 2, පර්. 26.54) විශාල ඉඩම සහ ගොඩනැගිලි ඇතුලු සියලු දේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 544/557 හි ලියාපදිංචි වී ඇත.

2. ඉහත කී වල්පොල පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් මැන සාදන ලද වර්ෂ 1966 මැයි මස 08 වන දින දරන අංක 667 දරන පිඹුර ප්‍රකාර හැඩවකගහලන්ද නමැති ඉඩමේ ලොට් ඩී දරන බෙද වෙන් කල කොටසට මායිම් උතුරට: කේ. පොඩි සිඤ්ඤෝ ප්‍රනාන්දු ට අයත් ඉඩම ද, නැගෙනහිරට : ලොට් ජී ද, දකුණට : ලොට් කේ ද (අඩි 8 පළල පාරක් සඳහා වෙන් වූ ඉඩම), බස්නාහිරට : ලොට් ජේ සහ අයි යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් පහයි දශම දෙකයි පහක් (අක්. 0, රූ. 2, පර්. 35.25) විශාල ඉඩම සහ ගොඩනැගිලි ඇතුලු සියලු දේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 544/547 හි ලියාපදිංචි වී ඇත.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නි. පිස්කල්,
දිසා අධිකරණය - මිනුවන්ගොඩ.

වර්ෂ 2017 ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින දී ය.

01-169

---

## පිස්කල් විකිණීමයි

### ගම්පහ දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : 287/MB
ඇස්කිසි අංකය : 91/2017

සම්පත් බැන්ක් පී. එල්. සී.
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 02.

*ශාඛා කාර්යාලය :*

අංක 72, කොළඹ පාර,
කඳාන

.............................*පැමිණිලිකරු.*

*එදිරිව*

පිංචා දේවගේ අසිත සුසාන් සෝමසිංහ,
කේෂාන් ඉන්ඩස්ට්‍රීස්,
අංක 385, ජයා මාවත,
පොල්පිති මූකලාන,
කඳාන

....................................*විත්තිකරු.*

වර්ෂ 2016 ක් වූ මාර්තු මස 10 වන දින දී ගම්පහ දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව එකී පැමිණිලිකරුට ඉහත කී විත්තිකරුගෙන් අයකර ගැනීමට ඇති රුපියල් 2,500,000 ක කාලීණ ණය පහසුකම සම්බන්ධයෙන් 2014.07.21 දිනට රුපියල් 2,274,165.52 මුදලක් සහ 2014.07.22 දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් 2,124,882.28 ක මුදලක් මතද නඩු තීන්දුවේ දින සිට හිඟ මුදල ගෙවා නිමවන තුරු සමස්ථ මුදල මත 14.5% පොලී ප්‍රතිශතයක් මත පොලියද රුපියල් 800,00 ක අයිරා පහසුකම් සීමාව සම්බන්ධයෙන් 2014.07.21 දිනට රුපියල් 510,563.17 ක මුදලක් සහ 2014.07.22 දිනට නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් 504,761.53 ක මුදලක් මතද නඩු තීන්දුවේ දින සිට හිඟ මුදල ගෙවා නිම වන තුරු සමස්ථ මුදල මත 18% බැගින් වූ පොලී ප්‍රතිශතයක් මත පොලිය ද තක්සේරු නඩු ගාස්තුද, වෙනත් ගෙවීම් ඇත්නම් ඒවා ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එම මුදල් අය කර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන් දේපල, 2018 ක් වූ පෙබරවාරි මස 06 වන දින පස්වරු 2.00 ට එම දේපල පිහිටි අංක 385, ජයා මාවත, පොල්පිති මූකලාන, කඳාන යන ලිපිනයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජා ඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරලේ පොල්පිති මූකලාන රාගම්පත්තුවේ පිහිටි දෙල්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මානක තැන සී. සෙනෙවිරත්න මහතා විසින් මැන සාදන ලද අංක 1853 සහ 2006.08.05 දින දරන පිඹුර ප්‍රකාරව අංක 02 දරන බිම් කොටසට මායිම්, උතුරට කැබලි අංක 07 (අඩි 10 ක් පළල පාර)නැගෙනහිරට පාර සහ ජයා මාවත දකුණට කැබලි අංක 01 බස්නාහිරට අංක 03 දරන බිම් කොටසට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ අටයි දශම තුනයි දෙක (A0, R1, P18.32) ක විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේද වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B715/197 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක සී. සෙනෙවිරත්න යන අය විසින් මැන සාදන ලද අංක 1853 සහ 2006.07.05 දිනැති පිඹුර ප්‍රකාරව අංක 07 දරන බිම් කොටසෙහි මාර්ග අයිතිය ද සමඟ වේ.

ඒ. එස්. අදිකාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය/පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2017 ක් වූ දෙසැම්බර් මස 12 වැනි දින දී ය.

01-202

## පිස්කල් මගින් වෙන්දේසියේ විකිණීමයි

## කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය

(සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

එල්. බී. ෆිනෑන්ස් පීඑල්සී,
අංක 275/75,
මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07.

නඩු අංක : HC/Civil/05/08/MR
ඇස්කිසී අංකය 24/2011

...............................පැමිණිලිකරු.

*එදිරිව*

01. සුවිසත මෝටර් හවුස් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ්,
284/4 බී, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.

02. දුම්බර මඩවලගේ කොන්සින් ගෙදර සුමනාවතී,
284/4 බී, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.

03. බෝදවඩුගේ සංජීව ගුණතිලක,
284/4බී, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ,

*සහ*

සුවිසත මෝටර් හවුස් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
63ජී, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිවු, කොළඹ 14.

04. අරුමා බදුගේ නිලූෂි රසාංජලී ද සිල්වා,
අංක 247/4, දළුවකොටුව, කොච්චිකඩේ.

................................විත්තිකරුවන්.

වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින දරන කොළඹ වාණිජ මහාධිකරණයේ ඇතුලත් කරන ලද නඩු තීන්දුව පරිදි ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු රු. 177,592 ක මුදලක් සහ ඒ මත 2007.03.27 වන දින සිට එකී මුදල් ගෙවා නිම කරන තෙක් වසරකට 48% ක් බැගින් වූ පොලියක් ද, අංක WP LA-3557 දරන වාහනයේ භුක්තිය යලිත් පැමිණිලිකාර සමාගමට බාරදෙනු ලබන දින තෙක් බදු ගිවිසුම කඩ කිරීම වෙනුවෙන් පැමිණිලිකරුට වන්දි වශයෙන් මසකට රු. 41,303 ක් බැගින් ද අංක WP LA 3557 දරන වාහනය යහපත් සහ මනා ක්‍රියාකාරිත්වයෙන් යුතුව පැමිණිලිකරුට ආපසු බාර දෙන ලෙස හෝ විකල්ප ලෙස එහි වටිනාකම වන රු. 1,213,043 ක මුදලක් ද 2007.05.28 වන දිනට රු. 1,671,666 මුදලක් සහ අලාභ ලබා දෙන ලෙසත් එකී දින සිට එම මුදල මත එය ගෙවා නිම කරන තෙක් වසරකට 48% බැගින් වූ පොලියක් ද නඩු ගාස්තු ද ගෙවීමට ඉහත විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් එම නඩුවේ නිකුත් වී ඇති දේපල තහනමට ගැනීමේ ආඥාව මත 2011.10.05 දින තහනමට ගන්නා ලද 04 වන විත්තිකාරියට හිමි පහත උපලේඛනයේ සඳහන් දේපල, වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 31 වන දින ප.ව. 2.30 එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපල මිළදී ගන්නා ගැණුම්කරු වෙන්දේසිය සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25% ක් ද වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30 ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කල යුතුය.

*පිවිසුම* : කොළඹ හලාවත පාරේ කොච්චිකඩේ, දළුවකොටුව හන්දිය සිට බේස්ලයින් පාරේ මීටර් 500 පමණ දුරින්.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ දූනගහ පත්තුවේ දැනට මීගමුව මහ නගර සභා සීමාව තුළ දළුවකොටුවේ පිහිටි සින්නමෝල නමැති ඉඩම ඊ. ඩී. ඕ. කොරයා මානක තැන 1980 අප්‍රේල් 4 සහ 5 වන දින මැන සාදන ලද අංක 538 ඒ දරන සැලැස්මේ ලොට් 8421/1 දරන කොටස උතුරුනැගෙනහිරට (ඊසානට) ලෙවිස් බාස්ගේ ඉඩම ද, දකුණුනැගෙනහිරට (ගිණිකොණට) ලොට් 8421/2 දරන කොටස ද, දකුණු බස්නාහිරට (නිරිතට) බේස්ලයින් පාර ද, උතුරු බස්නාහිරට (වයඹට) අර්ල් ප්‍රනාන්දුගේ ඉඩම ද යන මායිම් තුළ වූ පර්චස් දහ හතරයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 14.78) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ ගොඩනැගිලි ආදී සියළුම දෙයත් සමඟ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 554/131 දරන පත්‍රිරුවේ සඳහන් ඉඩම වේ.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර් /නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

2017 ක් වූ දෙසැම්බර් මස 14 වැනි දින දී ය.

01-225

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | | *තැපැල් ගාස්තුව* | |
|---|---|---|---|---|
| | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි කොටස : | | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 | 0 | 9,340 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 | 0 | 950 | 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 | 0 | 750 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 | 0 | 2,500 | 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 | 0 | 450 | 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 | 0 | 275 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 | 0 | 4,360 | 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 | 0 | 3,640 | 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 | 0 | 1,250 | 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 | 0 | 5,520 | 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | | **තැපැල් ගාස්තුව** | |
|---|---|---|---|---|
| I වැනි කොටස : | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 | 0 | 60 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 | 0 | 60 | 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 | 0 | 60 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 | 0 | 120 | 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 | 0 | 60 | 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 | 0 | 60 | 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 | 0 | 60 | 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2018.01.05 | සිකුරාදා | 2017.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.12 | සිකුරාදා | 2017.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.19 | සිකුරාදා | 2018.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.26 | සිකුරාදා | 2018.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2018.02.02 | සිකුරාදා | 2018.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.09 | සිකුරාදා | 2018.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.16 | සිකුරාදා | 2018.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.23 | සිකුරාදා | 2018.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2018.03.02 | සිකුරාදා | 2018.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.09 | සිකුරාදා | 2018.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.16 | සිකුරාදා | 2018.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.23 | සිකුරාදා | 2018.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.29 | බ්‍රහස්පතින්දා | 2018.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.